**ප්‍රසම්පාදන දැන්වීමයි.**
**ශික්ෂණ රෝහල - කුරුණෑගල.**

කුරුණෑගල ශික්ෂණ රෝහලේ ප්‍රසම්පාදන කමිටුව විසින් පහත සඳහන් රසායනාගාර උපකරණ මිලදී ගැනීම සඳහා විවෘත මිල ගණන් කැඳවනු ලැබේ.

| අංකය | විස්තරය | ප්‍රමාණය | ලංසු ඇපකර වටිනාකම | ආපසු නොගෙවනු ලබන ලංසු ලේඛන ගාස්තුව |
|---|---|---|---|---|
| 01 | Dual Head Microscope | 01 | 65,000.00 | 5,000.00 |
| 02 | Centrifuge Floor Model | 01 | 60,000.00 | 5,000.00 |
| 03. | Electrophoresis Analyzer | 01 | 180,000.00 | 5,000.00 |
| 04 | Tissue Embedding System | 01 | 250,000.00 | 5,000.00 |
| | | | | |

**02.** ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි NMRA සහතිකය ලබාගෙන ඇති ආයතන පමණක් අයදුම්පත් ඉදිරිපත් කලයුතු අතර ආපසු නොගෙවන ලංසු ලේඛන ගාස්තුව මෙම රෝහලේ සරප් අංශය වෙත ගෙවා ලබාගත් රිසිට්පතක් ඉදිරිපත් කිරීමෙන් පසු අදාල ලංසු ලේඛන හා තාක්ෂණික පිරිවිතර ගිණුම් අංශය වෙතින් ලබාගත හැකිය. අයදුම්පත් නිකුත් කිරීම **2023.11. 06** දින ප.ව. **3.00** දක්වා පමණි.

**03.** රු. 5,000,000.00 ට වැඩි වටිනාකමක් සහිත ලංසු සඳහා PCA3 සහතිකය ඉදිරිපත් කල යුතුය.

**04.** මාස 06 කට වලංගු වන පරිදි රජයේ ඕනෑම බැංකුවක හෝ, පිළිගත් පෞද්ගලික බැංකුවක ලංසු ඇපකර මුදල තැම්පත් කර ලංසු ඇපකර සහතිකයක් ඉදිරිපත් කල යුතුවේ.

**05.** සියළුම අයදුම්පත් **2023.11.07** දින පෙ.ව. **10.00** ට පෙර සභාපති , ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, ශික්ෂණ රෝහල, කුරුණෑගල යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. එසේ නැතහොත් මෙම රෝහලේ ප්‍රධාන ගණකාධිකාරි කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය. මිල ගණන් බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ අදාල උපකරණයේ නම සඳහන් කර මුල් පිටපත හා අනු පිටපත වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.
**06.** මේ සම්බන්දයෙන් පූර්ව ලංසු රැස්වීමක් **2023.10.25** වන දින පෙ.ව. **10.00** ට අධ්‍යක්ෂ කාර්යාලයේදී පැවැත්වීමට නියමිතය.

**07.** මිල ගණන් විවෘත කිරීම **2023.11.07** දින පෙ.ව. **10.00** ට අධ්‍යක්ෂ කාර්යාලයේදී සිදු කරනු ලබන අතර එම අවස්ථාවට ඔබට හෝ ඔබගේ නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

**08.** මෙම ප්‍රසම්පාදනය සම්බන්ද අවසාන තීරණය කුරුණෑගල ශික්ෂණ රෝහලේ ප්‍රසම්පාදන කමිටුව සතුවේ.
**09.** වැඩි විස්තර කාර්යාල වේලාව තුලදී දුරකථන අංක 0372222261- දිගු අංකය 2261 අමතා ගිණුම් අංශය විමසීමෙන් දැනගත හැකිය. ( මෙම දැන්වීම www.kurunegalahospital.health.gov.lk යන රෝහල් වෙබ් අඩවියේ පල කර ඇත.)

වෛද්‍ය චන්දන කැඳන්ගමුව
MBBS, MSc (Medical Administration) PGDBM, Mb
අධ්‍යක්ෂ
ශික්ෂණ රෝහල
කුරුණෑගල.

සභාපති,
ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,
ශික්ෂණ රෝහල,
කුරුණෑගල.